## විධායක සාරාංශය

පසුගිය නොවැම්බර් දහසය වැනි දින පැවැත්වුණු ජනාධිපතිවරණය, නිදහස් හා සාමකාමී එමෙන්ම සාර්ථක මැතිවරණයක් බවට පත්කර ගැනීම උදෙසා එක් වූ ශ්‍රී ලාංකේය ජනතාව වෙත, නිදහස් මැතිවරණ සඳහා වූ ආසියානු ජාලය තම සුභාශිංශන එක් කරනු ලබන්නේය. ජනතාව මෙන්ම දේශපාලන පක්ෂයන්හි ද විශ්වාසය දිනාගත් මැතිවරණ ක්‍රියාවලියක් සාක්ෂාත් කර ගැනීමෙහිලා අනල්ප වෙහෙසක් ගන්නා ලද මැතිවරණ කොමිෂන් සභාව වෙත ද විශේෂ ඇගයීමක් පිරිනැමිය යුතුව ඇත. තවද ජනාධිපතිවරණය සඳහා තරඟ කරන ලද දේශපාලන පක්ෂ මැතිවරණ ප්‍රතිඵල පිළිගනිමින්, ඒ කෙරෙහි තම විශ්වාසය පළ කිරීම මෙන්ම අප්‍රමාදව බලය පැවරීමේ ක්‍රියාවලියට ප්‍රවේශ වීම මඟින් තහවුරු වන්නේ ශ්‍රී ලංකාවේ ස්ථාපිත ප්‍රජාතන්ත්‍රවාදයෙහි පරිණත බව හා ඊට අනුයාත මැතිවරණ ක්‍රියාවලියේ සාර්ථකත්වයයි.

ශ්‍රී ලාංකේය ජනතාව මෙවර මැතිවරණ ක්‍රියාවලියේදී දැක්වූ සක්‍රීය සහභාගීත්වය සහ හැසිරීම මඟින් විද්‍යාමාන වන්නේ ඔවුන් තම රටේ අනාගත අභිවෘද්ධිය පිණිස එකට එක්ව ක්‍රියාකිරීමේ මනා ආදර්ශයක් ප්‍රදර්ශනය කර ඇති බවයි. තවද එය නිසැකවම ශ්‍රී ලංකාවේ මැතිවරණ ක්‍රියාවලිය නිරීක්ෂණය සඳහා පැමිණි අන්තර්ජාතික කණ්ඩායම් වෙතට ද සපයා ඇත්තේ මනා සාක්ෂියකි. පහතින් ඉදිරිපත් කරනු ලබන්නේ, අන්තර්ජාතිකව පිළිගත් ප්‍රජාතන්ත්‍රවාදී මැතිවරණ සම්මතයන් සහ මූලධර්මවලට යටත්ව මෙවර ජනාධිපතිවරණය පැවති බවට දිවයින පුරා සිදුකළ නිරීක්ෂණ හා ඒවා පාදක කර ගනිමින් එළඹෙන ලද නිගමන එළිදක්වමින් ආසියානු ජාලය විසින් සිදුකළ මූලික ඇගයීම පිළිබඳ වාර්තාවයි.

සමස්ත ඡන්ද ප්‍රතිශතයෙන් 83.9%ක ප්‍රමාණයක් සිය ඡන්දය ප්‍රකාශ කිරීම යනු මැතිවරණයක් පිළිබඳව මහජන විශ්වාසය සහ එමගින් ඇති කළහැකි වෙනස පිළිබඳව කැමැත්ත විද්‍යාමාන කරන්නකි. එනිසාම මැතිවරණ ක්‍රියාවලිය තුළදී, ඊට අදාළව සිදුවූ සියලු සිදුවීම් පිළිබඳව ඡන්දදායකයා මෙන්ම සෑම නිරීක්ෂකයෙක් ම කඩිනමින් ආමන්ත්‍රණය කිරීම මහජනතාවට මැතිවරණ ක්‍රියාවලිය පිළිබඳ විශ්වාසයක් ඇති කිරීමෙහිලා ඉතා වැදගත් වෙයි.

ඡන්දදායකයන් තම ඡන්ද ප්‍රකාශ කරන අවස්ථාවන්හි රහස්‍යභාවය ආරක්ෂාකොට නොතිබීම, ඡන්ද මධ්‍යස්ථාන තුළ පොලිස් නිලධාරියාගේ කාර්යයභාරය පැහැදිලි නොවීම සහ අවලංගු ඡන්ද පත්‍රිකා සම්බන්ධව ක්‍රියා කළයුතු ආකාරය පිළිබඳව නිලධාරීන්ට ස්ථිර අවබෝධයක් නොවීම ආදී සිදුවීම් හැරුණුකොට නොවැම්බර් මස දහසය වැනි දින පැවති ඡන්ද විමසීමේ ක්‍රියාවලිය නිසියාකාරව සිදුවූ බව ඉතා පැහැදිලිය. එනමුත් ආබාධ සහිත ඡන්දදායකයන් හට තම ඡන්දය භාවිත කරන ස්ථානයේදී පමණක් යම් ආකාරයක පහසුකම් ප්‍රමාණයක් ලබා දී තිබුණ ද, ඡන්ද මධ්‍යස්ථාන වෙත පැමිණෙන ඔවුන්ට එහි ළඟාවීම සඳහා පහසුකමක් නොවීම, ආසියානු ජාලයේ මැතිවරණ නිරීක්ෂකයන් තම නිරීක්ෂණයට ලක් කළ සෑම ඡන්ද මධ්‍යස්ථානයක ම පාහේ දිස් වූ සුලභ සංසිද්ධියක් විය. ශ්‍රී ලංකාවේ මැතිවරණ කොමිෂන් සභාව, අනෙකුත් සෙසු රාජ්‍ය ආයතන සහ සිවිල් සංවිධාන මෙකී කරුණ පිළිබඳව තම පූර්ණ අවධානය යොමුකරන ලෙස අපි නිර්දේශ කර සිටින්නෙමු.

ජනාධිපතිවරණය සඳහා අපේක්ෂකයන් තිස් පස් දෙනෙක් ඉදිරිපත් වී සිටියද, මැතිවරණ ප්‍රචාරණ කටයුතුවලදී අපේක්ෂකයන් සිව් දෙනෙක් පමණක් සමාජජාල මාධ්‍ය සහ අනෙකුත් මාධ්‍යය යොදාගනිමින් මැතිවරණ ප්‍රචාරණය කිරීම නිරීක්ෂණයට ලක් වූ එක් ප්‍රධාන කරුණකි. මෙකී කරුණු සලකා බලා සියලුම අපේක්ෂකයන් හට තම මැතිවරණ ප්‍රචාරණය කිරීම සඳහා යම් මූල්‍යමය දායකත්වයක් ලබාදීම පිණිස උචිත පාර්ලිමේන්තු අනුමැතියක් ගෙන, එය නීතියක් බවට පත් කරන්නේ නම් කිසිදු භේදයකින් හෝ

පරතරයකින් තොරව සෑම අපේක්ෂකයෙකු වෙතම තම මැතිවරණ ප්‍රචාරණය සඳහා ඉන් යම් සාධාරණ හා සාධනීය අවස්ථාවක් සැළසෙනු ඇතැයි යන්න අපගේ විශ්වාසයයි.

තැපැල් ඡන්ද ප්‍රකාශකිරීම ද ක්‍රමවත්ව හා සාමකාමීව සිදුවූ බව නිරීක්ෂණය විය. මැතිවරණ රාජකාරි කටයුතුවල යෙදී සිටින රජයේ නිළධාරීන් හා සාමාන්‍ය පුද්ගලයන් යන දෙපිරිසට ම තම තැපැල් ජන්ද ප්‍රකාශ කිරීමේ අවස්තාව ලබා දෙන්නේනම් එම ක්‍රියාවලිය තවත් වැඩිදියුණු කරගැනීමට හැකියාව පවතී. තවද තැපැල් ජන්ද ප්‍රකාශ කිරීමේ මධ්‍යස්ථාන ද ජන්දදායකයන්ට ළඟාවීමට පහසුවන පරිදි පිහිටුවීම අත්‍යවශ්‍යය අංගයක් බව පෙනීයයි.

මැතිවරණ ප්‍රචාරණ වියදම් සඳහා නිශ්චිත නියාමනයක් නොතිබීම ද මැතිවරණ ක්‍රියාවලිය ආශ්‍රිත ගැටළු උග්‍ර කරන්නක් වූ අතර පාර්ලිමේන්තුව මගින් මැතිවරණ ප්‍රචාරණ වියදම් නියාමනය කිරීම පිළිබඳ අවශ්‍යයෙන්ම පැවතිය යුතු නීතිමය ප්‍රතිපාදන සම්පාදනය ඉතා වැදගත් කර්තව්‍යයක් බව මේ අනුව පෙනීයයි. එමගින් වඩාත් සාර්ථක මැතිවරණ ක්‍රියාවලියක් ස්ථාපිත කල හැකි බව ආසියානු මැතිවරණ නිරීක්ෂණ ජාලයේ නිර්දේශයයි. එසේම මැතිවරණ කොමිසම, වෙනත් අපේක්ෂකයන්ට සහය පළකරමින් මැතිවරණ ප්‍රචාරයෙහි යෙදෙනු ලබන අපේක්ෂකයන් වැළැක්වීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග සහ නීති සම්පාදනය සඳහා ද මැදිහත් වන්නේ නම් එය ඉතා වැදගත් බව ද සටහන් කරන්නෙමු.

මැතිවරණ කාලසීමාවේදී අපේක්ෂකයන් විසින් සාම්ප්‍රදායික මෙන්ම සාම්ප්‍රදායික නොවන ප්‍රචාරණ ක්‍රම භාවිත කර තිබුණි. රාජ්‍ය හා පුද්ගලික මාධ්‍ය යන දෙඅංශය ම පක්ෂග්‍රාහී මාධ්‍යය භාවිතාවක නිරත වන ආකාරය දිස් වූ අතර ඉදිරි මැතිවරණවලදී එවැනි නිශේධනාත්මක ප්‍රවේශයක් මගහරවා ගැනීමට කටයුතු කිරීමට ඉතා වැදගත් වේ. මැතිවරණ අපේක්ෂකයන් සහ ඔවුන්ගේ ප්‍රතිපත්තින් පිළිබඳව යථාර්තවාදීව තොරතුරු ලබාගැනීමට ජන්දදායකයන්ට ඇති අයිතිය සහතික කිරීම සඳහා මාධ්‍ය ආයතන, තමන් විසින් ම ස්වයං ප්‍රතිපත්තිමය රාමුවක් සකස් කර ගැනීම කාලීන අවශ්‍යතාවයකි.

මනාප ජන්ද ක්‍රමයේ සංකීර්ණභාවය පිළිබඳව සහ වැදගත්කම පිළිබඳව ලාංකේය ජන්දදායකයාගේ දැණුවත්භාවයේ විශාල අඩුවක් දක්නට ලැබෙයි. බහුතරයක් වන ජන්දදායකයන්ගේ දැණුම්වත්භාවය පවතින්නේ එක් ඡන්දයක් ප්‍රකාශ කිරීමට පමණි. මේනිසා ශ්‍රී ලාංකේය ජන්දදායකයින් ට වඩා පුළුල් අවබෝධයක් ලබාදීමට මැතිවරණ කොමිසම උත්සාහ කළයුතුය. එම දැනුම්වත්කිරීම නාගරික ප්‍රදේශ වලට පමණක් සීමා නොවී ග්‍රාමීය ප්‍රදේශ වල ජනතාව දක්වා ම සිදුකළ යුත්තකි .

නොවැම්බර් දහසය වැනි දින පැවති ජනාධිපතිවරණය රටේ අනාගත මැතිවරණයන්ට බලපාන ප්‍රධාන මැතිවරණයක් වුවද මැතිවරණ ක්‍රියාවලිය පිළිබඳ දිවයිනේ වෙසෙන විවිධ ප්‍රජාවන් අතර වත්මනෙහි පවතිනවාට වඩා විශ්වාසයක් ඇතිකිරීම ඉතා වැදගත් සාධනීය පියවරක් වන බව ආසියානු මැතිවරණ ජාලයේ විශ්වාසයයි. එහිලා විධිමත් තොරතුරු සහිත, විනිවිදභාවයක් සහ වගවීමකින් යුක්ත ක්‍රියාදාමයක් අනුගමනය කිරීම මගින් තවදුරටත් මැතිවරණ ක්‍රියාවලිය පිළිබඳ මහජනතාවගේ විශ්වසනීයත්වය ළඟාකර ගැනීමට හැකියාව ලැබෙනු ඇතැයි යන්න පැවසිය යුතුමය.